# දෙමළ ජාතිවාදයේ වියරුව

පසුගියදා පාර්ලිමේන්තුවේ මහත් කලබැගෑනියක් සිදුවිය. පාර්ලිමේන්තුවේ දැන් සෑමදාම මෙන් කලබැගෑනියක් වන බැවින් එවැනි දේ ගැන ලිවීම කාලය කා දැමීමක් ලෙස කිසිවකුට පෙනී යා හැකි ය. මේ සිද්ධියට අදාළවන්නේ හිටපු ඇමතිවරයකු වූ මහේස්වරන් ය. මහේස්වරන්ට මහතා යැයි කීමට හැකියාවක් නැත. ඔහු නිවටයෙක් පමණක් වෙයි. ඔහු වෙනුවෙන් කතාකරන ඇතැම් ප්‍රබුද්ධයකු කියනු ඇත්තේ ඔහු තම  ජාතිය වෙනුවෙන් කතාකරන්නකු බව ය. නැත, ඔහු බටහිරයන්ගේ අවශ්‍යතාවට සිංහලත්වයට එරෙහි වන්නෙක් වෙයි. ඔහු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකි. එහෙත් ඔහු එහි විනයට යටත් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව යන ආකාරයට ඔහු මැති සබයේ දී ඡන්දය දෙයි. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධයෙන් වූ වැය ශීර්ෂයේ දී ඔහු පාර්ලිමේන්තුවේ සිටින කොටි නියෝජිතයන් වූ දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රීවරු සමග ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දුන්නේ ය. ඒ එසේ නොකර ඔහුට යාපනයට යෑමට නොහැකි නිසා යැයි එ ජා පක්ෂයේ නායකයන් සමහරවිට කියනු ඇත. ඒ කෙසේ වෙතත් ඔහු එ ජා පක්ෂයේ පිළිවෙත අනුගමනය කිරීම හෝ නොකිරීම යනු එ ජා පක්ෂයේ ප්‍රශ්නයක් වෙයි. අපට වැදගත්වන්නේ ඔහු පාර්ලිමේන්තුවේ කොටි නියෝජිතයන් සමග එක්වී ඡන්දය දීම ය.

ඒ මහේස්වරන් ම පාර්ලිමේන්තුවේ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ විවාදයේ දී ජනාධිපතිනියට කුණුහරුපයෙන් බැණ වැදී ඇත. ජනාධිපතිනිය විවේචනයට භාජනය කළ යුතු ය. අපි ද ඇය විවේචනය කරමු. අද ඇගේ එකම අභිලාෂය වී ඇත්තේ නැවත වරක් එක්කෝ ජනාධිපතිනිය වීම ය. නැතහොත් විධායක බලතල සහිත අගමැතිනිය වීම ය. ඒ සඳහා ව්‍යවස්ථාව වෙනස්කිරීමට ඇය වලිකන්නී ය. ඇගේ අවශ්‍යතාව වී ඇත්තේ හැකිනම් ජ වි පෙ නැතිව, බැරිම නම් ජ වි පෙ සමග, එ ජා පක්ෂයෙන් අවශ්‍ය මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් බාගෙන ව්‍යවස්ථාව වෙනස්කිරීම ය. මේ ව්‍යවස්ථාව බහුබූත ව්‍යවස්ථාවක් යැයි ඇය පවසයි. අධිකරණයට බලය පැවරෙන්නේ ද මේ ව්‍යවස්ථාව මගින් ය. ව්‍යවස්ථාවේ ඒ කොටස් ද බහුබූත ද නැත් ද  යන්න පිළිබඳ ව ඇය නිහඬ ය. මේ ව්‍යවස්ථාව විවේචනයකිරීමට අපට මෙන්ම ඇයට ද අයිතියක් ඇත. එහෙත් මගේ ප්‍රශ්නය වනුයේ ඇය තම බහුබූත කතා මගින් කුමක් කරන්නේ ද යන්න ය.  ඇය එස් බී දිසානායක මහතා මෙන් පොරක් (පොර යන්නෙහි ස්ත්‍රී ලිංගික පදය කුමක් ද? ඒ පොරණිය ද? පෙර ද? පොරී ද? පෙරණිය ද? නැත්නම් වෙනත් යමක් ද? ) වීමට ගැලරියට කතා කරන්නේ ද? ඇය ද ව්‍යවස්ථාවටත් එමගින් අධිකරණයටත් අපහාස කරන්නේ ද?

ඒ කෙසේ වෙතත් මහේස්වරන් පාර්ලිමේන්තුවේ දී ඇයට බැණවැදී ඇති ආකාරය අපි අනුමත නො කරමු. ඒ මහේස්වරන් ම නියෝජ්‍ය කතානායකවරයාට වීදුරුවකින් දමාගසා ඇත. එය පාර්ලිමේන්තුවටම කරන ලද අපහාසයකි. පාර්ලිමේන්තුවේ අද කොටි නියෝජිතයන් ක්‍රියාත්මක වන්නේ ව්‍යවස්ථාවට විරුද්ධ ආකාරයකින් ය. මන්ත්‍රීවරුන්ට රට බෙදීමට පක්ෂව කිසිම ආකාරයට කටයුතුකිරීමට නො හැකි ය. එහෙත් මහේස්වරුන් ද ඇතුළු කොටි නියෝජිතයෝ පාර්ලිමේන්තුවේ දී කිසිම පැකිලීමකින් තොරව රට බෙදීම වෙනුවෙන් පෙනී සිටිති. ඔවුන් කටයුතු කරන්නේ ද ව්‍යවස්ථාවට විරුද්ධව එයට පිටින් ය.

මේ නිවටයන් ඒ සියල්ල කරන්නේ පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවී බව තේරුම්ගත යුතුවෙයි. මොවුන්ට, විශේෂයෙන් ම පාර්ලිමේන්තු රීතිවලට පටහැණිව ක්‍රියාකරන මහේස්වරන්ට, විරුද්ධව කිසිම නීත්‍යානුකූල පියවරක් මෙතෙක් ගෙන නැත. එසේ නොගන්නේ ඇයි ද යන ප්‍රශ්නය මතුවෙයි. මොවුන් අද තැත්කරන්නේ සිංහලයන් බියවද්දාගෙන ජීවත්වීමට ය. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී බොරු චණ්ඩිකම් පාන මොවුහු එක් අතකින් ගත්කල චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අනුගමනය කරති.  එහෙත් බොරු චන්ඩිකමෙන් හෝ ඔවුන් අභියෝගකරන්නේ රටේ පාර්ලිමේන්තුවට ය. එහි ව්‍යවස්ථාවට ය. ව්‍යවස්ථාව යනු වෙනස් නොවන දෙයක් නො වෙයි. එහෙත් එසේ වෙනස්කිරීමට අවශ්‍යවූවිට ඒ කරන ක්‍රමයක් වෙයි. එසේ වෙනස්කිරීම ප්‍රභාකරන්ට හෝ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට හෝ අවශ්‍ය ආකාරයට කළ නො හැකි ය.

මේ නිවටයන්ගේ බියවැද්දීම් පසුපස ඇත්තේ තවත් නිවටයකු වූ ප්‍රභාකරන් ය. බටහිරයන්ගේ අනුග්‍රහයෙන් චන්ඩිකම්පාන මොහු පුම්බනු ලැබූ නිවට මිනීමරුවෙක් වෙයි. බටහිරයන් නැත්නම් මොහු මෙලහකටත් එලොව ගොස්

© Prof. Nalin De Silva

ය. අද ඔහු පවත්වාගෙන යනු ලබන්නේ බටහිරයන් හා ඔවුන්ගේ හෙන්චයියන් අනුකාරකයන් හා කුලීකරුවන් වූ ඇතැම් ප්‍රබුද්ධයන් විසිනි. එහි දී ජනමාධ්‍යකරුවන් නමින් පෙනී සිටින ඇතැම් ප්‍රබුද්ධයෝ ද යම් කාර්යභාරයක් ඉටුකරති. ප්‍රභාකරන් යන නිවටයා අනභිබවනීය ඊනියා ගරිල්ලා භටයකු ලෙස හඳුන්වනු ලැබුයේ බීබීසීය ප්‍රමුඛ බටහිර ජනමාධ්‍ය විසිනි. බීබීසිය යනු එහි අගුපිලේ වැතිර බටහිර තම ස්වාමීන්ගේ අවශ්‍යතා ඉටුකරන කසිකබල් සංදේශය නො වෙයි. මේ සංදේශකරුවන් යනු බ්‍රිතානි යටත්විජිතවාදයේ හා ඊනියා ගෝලීයකරණය නමින් ක්‍රියාත්මකවන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතකරණයේ  සංදේශකරුවන් මිස ජනමාධ්‍යකරුවන් නොවන බව පැහැදිලි ය.  අද සංදේශයේ කසිකබල් සංදේශකරුවකු වීම සඳහා අවශ්‍යවන ප්‍රධානම සුදුසුකම සිංහල බෞද්ධ විරෝධත්වය ය.

කලකට පෙර මෙරට ජීවත් වූ ඉංගිරිසි ජනමාධ්‍යකරුවකු වූ මර්වින් සිල්වා, ප්‍රභාකරන් දශකයේ පුරුෂයා ලෙස නම්කෙළේ ය. සිංහල විරෝධී ස්ථාවරයක පිහිටි මර්වින් සිල්වා මහා ජනමාධ්‍යකරුවකු ලෙස හඳුන්වා දෙනු ලබන්නේ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයේ නියෝජිතයන් විසිනි. අද ලෝකයේ ක්‍රියාත්මකවන නූතනත්ව ක්‍රිස්තියානිකරණයට ප්‍රබුද්ධයෝ සියල්ලෝම එකඟවෙති. මෙහි ක්‍රිස්තියානිකරණය යනු ක්‍රිස්තියානි ආගමට හැරවීම නොව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට හැරවීම ය. ඒ සංස්කෘතිය ක්‍රිස්තියානි ආගම ඇසුරෙන් ද නිර්මානය වී ඇති බව නම් සැබෑ ය. ඕල්කට් බෞද්ධයෝ ද සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වෙති.

දශකයේ පුරුෂයා, අනභිබවනීය ගරිල්ලා සටන්කරුවා ආදී වශයෙන් හඳුන්වාදෙනු ලැබූ ප්‍රභාකරන් අද යන ගී කියවයි. ඔහු අද ක්‍රියාකරන්නේ වියරුවෙන් ය. ඔහුට අද ඊනියා උතුර නැගෙනහිරක් නැත. උතුරු හා නැගෙනහිර පළාත් ඓතිහාසික, සංස්කෘතික හා භූගෝලීය වශයෙන් වෙනස් බව කරුණා පෙන්නුම් කර ඇත. ප්‍රභාකරන්ට මෙන්ම පාර්ලිමේන්තුවේ ඔහුගේ නියෝජිතයන් වූ සම්බන්ධන් ප්‍රධාන කොටි මන්ත්‍රීවරුන්ටත් මහේස්වරන්ටත් අවශ්‍ය වන්නේ කෙසේ හෝ වෙනම රාජ්‍යයක් ලබාගැනීම ය. අද ඔවුන්ගේ උපාය වී ඇත්තේ සාකච්ඡා සඳහා නොඑන්නේ නම් නැවතත් ආයුධ ගැනීමට සිදුවන බව කීම ය. මෙහි දී කරුණු දෙකක් කිවයුතු ය. පළමුවෙන් ම ඔවුන් සාකච්ඡා යනුවෙන් හඳුන්වන්නේ ඊනියා අන්තර්වාර ස්වයං පාලන අධිකාරියක් ලබාගැනීමට කරන සාකච්ඡා ය. ඒ සාකච්ඡාවක් නොව ඔවුන්ගේ ඉල්ලීමට එකඟ වී ඊළම ලබාදීමට පියවරගැනීම ය. එවැනි ඊනියා සාකච්ඡාවක් සඳහා එකඟවිය හැක්කේ මහේස්වරන් සාමාජිකත්වය දරණ එ ජා පක්ෂයට හා රාජ්‍ය නොවන සංවිධාන යැයි හැඳින්වෙන එහෙත් බටහිර රාජ්‍ය මැදිහත්වීමෙන් පවත්වාගෙන යනු ලබන සංවිධාන ප්‍රමුඛ ආයතනවලට ය . ඇලවියක් නැති සතිඅන්ත පත්තර කඩමාළුවලට ද ඒ ඊනියා සාකච්ඡාවලට එකඟවිය හැකි ය. කෙටියෙන් කිවහොත් සිංහලත්වයට විරුද්ධ නූතනත්ව ක්‍රිස්තියානි නියෝජිතයන්ට එයට එකඟ විය හැකි ය. දෙවනුව කොටි කිසි දිනෙක ආයුධ අත් නො හැරියහ. රනිල් වික්‍රමසිංහ - ප්‍රභාකරන් අවබෝධතා ගිවිසුම අනුව සිදුවූයේ හමුදාව ආයුධ පාවිච්චිය  අත්හැරීම ය. අද හමුදාව සිංහලත්වයට විරුද්ධවූවනට අවශ්‍ය ආකාරයට සිල්ගෙන ඇත. ස්ටැන්ලි තම්බයියා, ගණනාථ ඔබේසේකර වැනි බටහිර නූතනත්ව ක්‍රිස්තියානි සමාජවිද්‍යාඥයන්ට මෙන්ම ඊනියා ප්‍රබුද්ධයනට ද අවශ්‍ය සිල්ගත් හමුදාවකි. ඔවුහු බුදුහාමුදුරුවන්ටත් වඩා බෞද්ධ වෙති. බුදු හාමුදුරුවෝ කිසි දිනෙක හමුදාවනට සිල්ගැනීමට දේශනා නොකළහ. උන්වහන්සේ අඩුතරමින් රජවරුන්ට තම හමුදා විසුරුවාහැරීමට අවවාද නොකළහ. හමුදා ඇත්තේ කොස් කෙටීමට නොවන බව ද උන්වහන්සේ දැනසිටියහ. සමහරවිට ප්‍රබුද්ධයන් නම් සිතනු ඇත්තේ බුදු හාමුදුරුවන් හමුදා කොස් කෙටීමට යොදාගන්නේ යැයි විශ්වාස කළ බව ය. එමෙන් ම බුදුන් වහන්සේ හමුදා භටයකු පැවිදිවන්නේ නම් රජුගෙන් අවසර ගත යුතු බවට ද නීතියක් පැණවූහ. එයින් කියැවුණේ හමුදාව පවත්වාගෙන යෑමේ වැදගත්කම බුදුන්වහන්සේ ප්‍රශ්න නොකළ බව ය. කෙසේ වෙතත් බුදුහාමුදුරුවන්ටත් වඩා බුදුදහම දන්නා ප්‍රබුද්ධයන් හා බටහිරයන් හේතුකොටගෙන අද හමුදාව සීරුවේ නැත. එහෙත් කොටි දිගින් දිගටම මිනී මරති. එවිට ආණ්ඩුව ශෝකප්‍රකාශයක් කර නිහඬවෙයි.

මේ අවසාන අවස්ථාව බව කොටි මෙන්ම මහේස්වරන්ලා ද නූතන මර්වින් සිල්වාලා ද දනිති. ප්‍රභාකරන් වියරුවෙන් ය. ඔහු කෙතරම් පාරම් බෑව ද ඔහුට හුදකලා මිනිසුන් මැරීම හැරෙන්නට හමුදාව සමග සටනක් කළ නො හැකිවෙයි. ඔහුගේ තර්ජන වියරුවෙන් කරන බොරු බියගැන්වීම් පමණ ය. අප ඒ තර්ජන හමුවේ නොසැලී හමුදාව සීරුවෙන් තබා කොටින්ට පහර දීමට සූදානම් විය යුතු ය.

© Prof. Nalin De Silva